**පටිච්චසමුප්පාදය (දොළොස්වෙනි කොටස)**
18.08.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

සැම දෙනාටම තෙරුවන් සරණයි! අපි මේ දවස්වල කථා කරන්නේ පටිච්චසමුප්පාදය. අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා ආශිර්වාද කරනවා මේ කියා දෙන්නාවූ ධර්ම කරුණු සියල්ලම මේ පින්වත් සැමදෙනාටම ඉතාමත් පැහැදිලිව පිරිසිදුව හොඳින් තේරුම් අරගෙන වටහාගෙන ඒවාගේම හේතු ඵල ධර්මයන් හොඳට වටහාගෙන හේතු ඵල ධර්මයන්ගෙන් මිදිලා හේතු ඵල ධර්මයක් නැති අසංඛත ධාතු සංඛාත නිර්වාණ ධාතුවෙන් සැනසෙන්න ලැබේවා කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස **භව පච්චයා ජාති** කියන තැන **ජාති** කියන්නේ ඉපදීම. **නාමරූප පච්චයා සළායතනං** - එතකොට උපදින්න ඉස්සෙල්ලා තමයි සළායතන ඇතිවෙන්නේ. මට තිබෙන ප්‍රශ්නය තමයි **නාමරූප පච්චයා සළායතනං** කියන එකයි භව පච්චයා ජාති කියන එකයි අතර තිබෙන සම්බන්ධය. ඒ කියන්නේ ජතිය ඇතිවීමට පෙර සළායතන ඇති වෙන්නේ කොහොමද කියලා.

<u>පිළිතුර</u> - පටිච්චසමුප්පාදය ගැන කියනකොට නිතරම මම මතක් කරන දෙයක් තමයි බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදය දේශනා කරනකොට මාතෘකා පද 12 දේශනා කරනවා. ඒ මාතෘකා පද 12 න් තමයි සංකීර්ණ ක්‍රියාවලියක් පෙන්නුම් කරන්නේ. දැන් මේක පාඩම් කරගත්ත අපිට ඒක එක වෙලාවේ බලන්නත් ඕනෑ. එක වෙලාවකම ඒකට එන්න ඕනෑ. මේක බොහෝ අයට තිබෙන්නා වූ ප්‍රශ්නයක්.

ප්‍රතිසන්ධිය හැම වෙලාවේමත් නෑ. මරණයත් හැම වෙලේම නෑ. මේකේ තිබෙන්නේ අමුතුම ක්‍රියා වලියක්. පටිච්චසමුප්පාදයේ තිබෙනවා **නා නා ක්ෂණික පටිච්චසමුප්පාදය** සහ **ඒකක්ෂණික පටිච්චසමුප්පාදය. නා නා ක්ෂණික පටිච්චසමුප්පාදය** තමයි එක ධර්මයක් ඉස්සෙල්ලා පහළ වෙලා ඊට පසුව තවත් ධර්මයක් පහළ වෙනවා කියලා පිළිවෙලකට කියාගෙන යන වෙනස් වෙනස් අවස්ථාවල තිබෙන ධර්ම. දැන් අපිට චක්ඛු විඤ්ඤාණය පහළ වෙනවා. ඒක විපාකයක්. ඒක මේ වෙලාවේ විපාකය වූ කල ඒ විපාකය ඇති වීමට කරපු කර්මය දැන් කරපු එකක් නොවෙයි. අපි දන්නේ නෑ ඒක කොහෙද කරලා තිබෙන්නේ කියලා. එතකොට ඉස්සෙල්ලා වෙනත් ක්ෂණයක තමයි අපි ඒ කර්මය කළේ. දැන් තමයි ඒකෙ විපාකය ලැබෙන්නේ. එතකොට ඒක නා නා ක්ෂණිකයි.

පෙර භවය { අවිජ්ජා, සංඛාර }

අපි මේක මේ විදියට තේරුම් ගනිමු. ඉස්සෙල්ලා ජීවිතියේ අවිද්‍යාව නිසා සංඛාර හැදුවා. මේකෙන් කියන්නේ අවිද්‍යාව නිසා කර්ම හැදුවා කියලා. මේ දෙක ඇතුලේ තවත් දේවල් තිබෙනවා නමුත් කැපී පෙන්නේ **අවිද්‍යාව සහ සංඛාර.**

---

විඤ්ඤාණං = ප්‍රතිසන්ධි විඤ්ඤාණය (විඤ්ඤාණ 6 ක් තිබෙනවා) නමුත් මවු කුසේ පහළ වෙන්නේ චක්ඛු විඤ්ඤාණයත් නොවෙයි සෝත විඤ්ඤාණයත් නොවෙයි ඝාණ විඤ්ඤාණයත් ජිව්හා විඤ්ඤාණයත් කාය විඤ්ඤාණයත් නොවෙයි. මවු කුසේ පහළ වෙන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය. ඒක මනෝ විඤ්ඤාණයක්.

නාම - රූප
සළායතන
ඵස්ස
වේදනා
තණ්හා
උපාදන

<u>හව</u> – කර්ම භවය / උප්පත්තිය

විඤ්ඤාණ - නාම රූප - සළායතන - ඵස්ස - වේදනා - තණ්හා - උපාදන - භව.

දැන් හොඳට හිතලා බලන්න. ප්‍රතිසන්ධි විඤ්ඤාණය කියලා කියන්නේ මේ ආත්මයේ එකක්. ඒවගේම අපිට හම්බවෙලා තිබෙන නාම රූප ඔක්කොම මේ ජීවිතියේදී ලැබුණ දේවල්. දැන් ලැබිලා තිබෙන ඇස කන නාසය ආදී සළායතන සියල්ලමත් මේ ජීවිතියේදී ලැබිච්ච දේවල්. මේ සළායතන නිසා ස්පර්ශය ලැබෙනවා, ඊට පස්සේ වේදනා තණ්හා උපාදාන **<u>භව</u> ඇතිවෙනවා.**

දැන් බලන්න **<u>භවය</u>** කියන තැන. 'භවය' කියන එකයි 'සංඛාර' කියන එකයි සමාන ස්වරූපයක් ගන්නවා. මම මේ භවය කියන එක **කර්ම භවය** සහ **උප්පත්ති භවය** කියලා දෙකට කැඩෙනවා. කර්ම භවය සහ උප්පත්ති යන දෙකටම තමයි 'භවය' කියලා කියන්නේ.

මෙතැනදී උප්පත්ති භවය සහ විඤ්ඤාණය සමානයි වගේ පේනවා. ඒක නිසා වර්තමානයේදී අපි උප්පත්ති භවය කියන එක අයින් කරනවා. එතකොට ඉතුරු වෙන්නේ 'කර්ම භවය' පමණයි.

'කර්ම භවය' කියලා කියන්නේ කර්ම හදනවා කියන එකයි. අවිජ්ජා පච්චයා සංඛාරා කියන තැන සංඛාර කියන්නෙත් කර්මම තමයි. එතැන කියන්නේ දැනට අපිට ලැබී ඇති

ආයතන ආදී දේවල් ලබා ගැනීම පිණිස හේතු වූ පෙර හවයේ කරන ලද කර්ම. ඒක නිසා 'සංඛාර' කියන එකයි 'කර්ම හවයයි' කියන්නේ එකම දේ. ඒවා සමානයි. හව නිසා ඇති වෙනවා ජාති. ජාතිය නිසා ඇතිවෙනවා ජරා මරණ

අවිජ්ජා<br>
සංඛාර } පෙර හවය

---

විඤ්ඤාණං<br>
නාම - රූප<br>
සළායතන<br>
ඵස්ස<br>
වේදනා<br>
තණ්හා<br>
උපාදන<br>
හව } වර්තමාන හවය

---

ජාති<br>
ජරා මරණ } අනාගත හවය

මෙහි 'ජාතිය' කියන එක සමානයි 'ප්‍රතිසන්ධි විඤ්ඤාණයට'. (සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං) එතැනදී 'විඤ්ඤාණං' කියලා කියන්නේ ධර්ම ස්වභාවයේ හැටියට. 'ජාතිය' කියලා කියන්නේ ක්‍රියාවේ හැටියට. ජාතිය කියන්නේ 'පහළ වෙනවා' 'උපදිනවා' 'මතු වෙනවා' කියන එක. 'ජාතිය' කියලා කියන්නේ ක්‍රියා අර්ථයෙන් එනම් හට ගන්නා ස්වභාවයෙන්. 'විඤ්ඤාණය' කියලා කියන්නේ ඒ හට ගන්නා දේ 'නම' වශයෙන් සඳහන් වෙන තැන. අපි ඒක මේ විදියට බලමු.

එක්කෙනෙක් කියනවා 'අන්න උයලා තිබෙනවා කන්න' කියලා. තව එක්කෙනෙක් කියනවා 'අන්න කෑම තිබෙනවා කන්න' කියලා.

- 'උයලා තිබෙනවා කන්න' කියලා කියන කොට කියන්නේ 'උයලා' කියන ක්‍රියාව මුල් කරගෙන. එයා උයල තිබෙන 'කෑම' ගැන කියන්නේ නෑ.

- 'අන්න කෑම තිබෙනවා කන්න' කියන එකෙන් කියන්නෙත් උයලා තිබෙන කෑම කන්න කියලා. නමුත් එතැනදී 'උයලා' කියන ක්‍රියාව ගැන සඳහන් කරන්නේ නෑ.

උයනවා කියලා කියන්නේ ක්‍රියාව - කෑම කියලා කියන්නේ නාමය. 'විඤ්ඤාණය' කිව්වහම 'කෑම තිබෙනවා කන්න' කියනවා වගෙයි. 'ජාතිය' කියනකොට 'උයලා

තියෙනවා කන්න’ කියනවා වගෙයි. එතැන කියන්නේ ක්‍රියාව මුල් කරගෙන. ජරා මරණ කියන තැන තිබෙන්නෙත් ක්‍රියා සවරූප. මරණයට පත්වෙනවා කියන එක වස්තුවක් නොවෙයි. ඒක අල්ලන්න පුළුවන් එකකුත් නොවෙයි. මරණය කියන එක එක්තරා ක්‍රියා වලියක්. ජරාව කියන එකත් දිරා යෑම කියන ක්‍රියාවට යටත් වූ එකක්. ඒක ක්‍රියා වලියක්, ඒක පේන්නේ නෑ. අපි ජරාවට පත් උනා කියලා කියන්නේ දිරා යෑමේ ක්‍රියාවට යටත් වෙලා දිරාවට පත් වූ දේකට.

‘සංඛාර’ කියලා කියන්නේ නිෂ්පාදනය වෙනවා කියන එක. ‘භව’ කියන්නෙත් සංස්කාර (කර්ම) හැදෙනවා කියන එක. පෙර භවයේ හැදුන සංස්කාර වර්තමාන භවයට උදව් උනා. භවය කියන ක්‍රියාව තුල සකස් වෙන සංස්කාර අනාගත භවය සැකසීමට උදව් වෙනවා. මෙතැන ජීවිත තුනක් තිබෙනවා. මේ ජීවිත තුන එකට ගැටගැහිලා රවුම් වෙලා තිබෙන්නේ.

අවිජ්ජා
සංඛාර
} පෙර භවය

---

විඤ්ඤාණං
නාම - රූප
සළායතන
ඵස්ස
වේදනා
තණ්හා
උපාදන
භව
} වර්තමාන භවය

---

ජාති
ජරා මරණ
} අනාගත භවය

වර්තමාන භවයේ තිබෙන ස්පර්ශය පෙර භවයේ සංස්කාර නිසා හැදුන එකක් නොවෙයි. ස්පර්ශය සිදු වෙන්නේ පෙර කර්මයෙන් නොවෙයි. ස්පර්ශ වෙන දේවල් හැදිච්ච හින්දයි ස්පර්ශය සිදු වෙන්නේ. සළායතන නිසයි ස්පර්ශය සිදුවෙන්නේ. සංස්කාර නිසා ඇති උනා විඤ්ඤාණ - නාම රූප - සළායතන. නාම රූප කොහේ හරි තැනක තිබෙනවද එතැන සළායතන තිබෙනවා. සළායතන කොහේ හෝ තැනක තිබෙනවාද එතැන ස්පර්ශය සිදු වෙනවා. ස්පර්ශය සිදු වූ තැන අනිවාර්යෙන්ම වේදනාව තිබෙනවා. ඊට පස්සේ තමයි තණ්හා උපාදාන භව ඇතිවෙන්නේ. තණ්හා උපාදාන තැවරුණ තැන කර්ම හැදෙනවා. මේ විදියට භව තුනක් - ආත්ම තුනක් වශයෙන් තමයි මේක තිබෙන්නේ.

අපි හැමවෙලේම ඉන්නේ වර්තමානයේ. වර්තමාන ඵලය හැම වෙලේම නැකම් කියන්නේ අතීතයට. අපේ ආච්චිලා සීයල තමයි සංස්කාර. ඒකට අවිද්‍යාව තමයි ප්‍රධාන හේතුව. අතීතයේ ඵලය තමයි වර්තමානය. වර්තමානයත් නිකම්ම තිබෙන්නේ නෑ. ඵලය කැරකැවි කැවී සුළි හැදී හැදී අනාගත භවයට යනවා. ඒක නිසා මේක ජීවිත තුනක විස්තරයක්.

'ජාතිය' කියන එක අනාගතයට තිබෙන ක්‍රියාවක්. 'ජාතිය' කියන එක සිද්ධ වෙන්නේ 'භව' හැදුනොත් පමණයි. 'භවය' හැදීම පිණිස ළඟින්ම ඉන්නේ 'තණ්හාව' සහ 'උපාදානය'.

තණ්හාව සහ උපාදානය තිබෙන කොට අපිට හිතෙනවා අවිද්‍යාව නම් පරණ එකක්, ඒක නිසා අවිද්‍යාව නැතුව ඇති කියලා. නමුත් එහෙම නෑ. තණ්හා උපාදන ඉස්මතු උනාට අවිද්‍යාව සංඛාර යටින් ඉන්නවා. ඒවගේම තමයි පෙර භවයේ අවිද්‍යාව නිසා සංඛාර හැදෙන අවස්ථාවේ තණ්හා උපාදාන භව තිබුණා.

අතීත භවය { අවිජ්ජා, සංඛාර } තණ්හා, උපාදාන, භව

---

වර්තමාන භවය { විඤ්ඤාණං, නාම - රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදන, භව }

{ තණ්හා, උපාදන, භව } අවිජ්ජා, සංඛාර

---

අනාගත භවය { ජාති, ජරා මරණ }

යම්කිසි තැනක තණ්හාව තිබෙනවද ඒ තණ්හාව තිබෙන තැන අනිවාර්යෙන්ම අවිද්‍යාව තිබෙනවා.

මෙතැනදී අපිට ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන් අනාගතයට තිබෙන්නේ ජාති ජරා මරණ විතරද කියලා. ජාතිය කියන්නේ ඉපදීම. ඉපදීමට යම්කිසි දෙයක් තිබිය යුතුයි. ජරා මරණ කියලා කියන්නේ දිරා වැනසී යෑම. අපි මෙහෙම හිතමු. පිළුණු වෙනවා කියලා දෙයක් තිබෙනවා. පිළුණු වෙන්න නම් මොකක් හරි දෙයක් තිබෙන්න ඕනෑ. මොකක් හරි දෙයක් නැත්නම් පිළුණු වෙන්නේ නෑ. පිළුණු වෙනවා කියපු ගමන්ම පිළුණු වීමට ගොදුරු වෙන

දෙයක් තිබෙන්න ඕනෑ. ඒවගේ 'ජාතිය' කියලා කිව්වහම ඉපදීමට යටත්වෙන ඉපදෙන්න දෙයක් තිබෙන්න ඕනෑ. ඒක නිසා ඉපදෙනවා කියන එක තිබෙන්නේ තවත් එකක ගෑවිලා.

උපත්තිය වෙන්නේ විඤ්ඤාණයක් - උපත්තිය වෙන්නේ නාම රූප - උපත්තිය වෙන්නේ සළායතන - ඵස්ස - වේදනා - තණ්හා ආදී සියල්ල උපදිනවා, නමුත් විශේෂයෙන්ම විඤ්ඤාණය කියන එක පහළ වෙනවා.

**ජාති ජරා මරණ** කියන තැන තිබෙන්නේ ක්‍රියාවේ නමින්. **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියන තැන තිබෙන්නේ ධර්ම ස්වභාවයේ නමින්.

ජාති ජරා මරණ කියන එක මේ විදියට තේරුම් ගන්න.

- විඤ්ඤාණයේ පහළ වීම = ජාතිය
  විඤ්ඤාණයේ පරණ වීම = ජරාව
  විඤ්ඤාණයේ කඩාවැටීම = මරණය

ඒක නිසා ජාති ජරා මරණ 'විඤ්ඤාණය' තුල කැවී තිබෙනවා. ඒක උලුප්පලා පෙන්නන අවස්ථාව තමයි 'ජාති' 'ජරා මරණ' අනාගතය භවයට දාල පෙන්නන අවස්ථාව.

- නාම රූප වල හටගැනීම = ජාතිය
  නාම රූප පරණ වීම = ජරාව
  නාම රූප නැති වීම = මරණය

- සළායතන හටගැනීම = ජාතිය
  සළායතන පරණ වීම = ජරාව
  සළායතන නැති වීම = මරණය

ඒක නිසා 'විඤ්ඤාණයෙත්' 'නාම රූප වලත්' 'සළායතන වලත්' තිබෙනවා ජාති ජරා මරණ.

ඒවගේම තමයි ස්පර්ශය. ස්පර්ශය පහළ වෙනවා, ටික වෙලාවක් තිබෙනවා නැතිවෙනවා.

- ස්පර්ශයේ පහළ වීම = ජාතිය
  ස්පර්ශයේ පැවතීම = ජරාව
  ස්පර්ශයේ නැති වීම = මරණය

- වේදනාවේ හට ගැනීම = ජාතිය
  වේදනාවේ පරණවීම = ජරාව
  වේදනාවේ නැතිවීම = මරණය

- තණ්හාවේ ඉපදීම = ජාතිය
  තණ්හාවේ පරණවීම = ජරාව
  තණ්හාවේ කඩාවැටීම = මරණය

- උපාදානයත් ඇති වෙනවා - ජරාවට යනවා - මැරෙනවා.

- භවය = කර්මය. කර්මය හට ගන්නවා - පවතිනවා - නැතිවෙනවා. ඒකත් ජරා මරණයට පත්වෙනවා.

ඒක නිසා මේ ජරා මරණ හැම එකක් තුලම තිබෙනවා. ඒ කියන්නේ සෑම ක්‍ෂණයක් තුලම ජරා මරණ තිබෙනවා කියන එක. එතකොට අපිට තේරෙනවා ආනගතයට බාර කරපු ජරා මරණ මේ හැම එකක් තුලමත් තිබෙනවා කියලා.

ඒවගේම පෙර භවයේ පහළ වූ අවිද්‍යාව තුලත් සංඛාර තුලත් ජාති ජරා මරණ තිබුණා.

- අවිද්‍යාවේ හටගැනීම = ජාතිය
  අවිද්‍යාවේ පරණ වීම = ජරාව
  අවිද්‍යාවේ මැරීම = මරණය

  සංස්කාර හට ගැනීම = ජාතිය
  සංස්කාර පරණ වීම = ජරාව
  සංස්කාරයගේ මැරී යෑම = මරණය

ඒක නිසා ජාති ජරා මරණ හැම තැනම තිබෙනවා. ජාතියට සහ ජරා මරණය ඇති වෙන්න නම් හට ගන්න දෙයක් තිබෙන්න ඕනෑ - පරණ වෙන්න දෙයක් තිබෙන්න ඕනෑ - මැරෙන්න දෙයක් තිබෙන්න ඕනෑ. ඉහත සඳහන් සියලුම අංග තුල ජාති ජරා මරණ තිබෙනවා. නමුත් පටිච්චසමුප්පාද අංග සඳහන් කිරීමේදී ජරා මරණ සඳහන් වෙන්නේ අන්තිමට. ජාති ජරා මරණයන්ට ගොදුරු වෙන ඊට ඉහතින් ඇති සියලුම දේ ඒකෙන් නිරූපණය වෙනවා. මේවා සියල්ලම interrelated – interconnected.

අපි සමහර වෙලාවට පුද්ගලයෙකුගේ නමක් සඳහන් කරන්නේ නැතුව කියනවා ‘අන්න ආවා’ කියලා. ‘ආවා’ කියලා කියන්නේ ක්‍රියාවක්. ඒ ක්‍රියාවට යටත් වෙච්ච එක්කෙනා නිර්නාමිකයි. නමුත් ‘ආවා’ කියලා කියනවා ඇහුණාම අපි බලන්නේ ඒ අපු කෙනා කවුද කියලා. ඒවගේම තමයි ‘අන්න ඉව්වා’ කියලා කිව්වහම අනිවාර්යෙන්ම ඒක ආහාරයක් කියලා අපි දැනගන්නවා. ‘ඉව්වා’ කියන වචනය නියෝජනය කරන්නේ ආහාර. ‘ඉව්වා’ කියන වචනය ගැන නොවෙයි ඒකට යටත් වෙච්ච දේ ගැනයි අපි හිතන්නේ.

අන්න ඒ වගේ 'ජාතිය' කියලා කිව්ව ගමන්ම ඒකෙන් කියනවා විඤ්ඤාණය පහළ උනා - ජීවිතය පහළ උනා - නාම රූප පහළ උනා - සළායතන ආදී සෑම දෙයක්ම පහළ උනා කියලා. 'ජරා මරණ' කියන කොට ඒකෙන් කියනවා ඒ සියල්ලන්ගේම දිරා යෑම සහ නැතිවීම.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි නැති කර ගත්තේ නැත්නම් අවිද්‍යාව කියන එක දිගටම පවතින එකක් නේද?

<u>පිළිතුර</u> - ඒක නොවෙයි මෙතැන කියන්නේ. ඕක වරදින තැනක්. වරදිනවා කියන්නේ එහෙමනම් අනිත් සියලුම දේ වෙනස් වෙලා අවිද්‍යාව පමණක් ස්ථිර වෙනවා. එහෙම වෙන්නේ නෑ. අවිද්‍යාව තිබෙනවා, අවිද්‍යාව කියලා කියන්නේ මනසේ හැදෙන්නා වූ එක්තරා චෛතසික ධර්මයක්. ඒ චෛතසික ධර්මය අකුසල් සිත්වල පමණක් පහළ වෙනවා. 'මෝහය' කියන චෛතසිකයට තමයි අපි අවිද්‍යාව කියලා නම් කරන්නේ.

නමුත් ඒ මෝහ චෛතසිකය හෙවත් අවිද්‍යාව කියන ධර්මය මරණයට ගොදුරු වෙන්නේ නැත්නම් ඒකෙ විශේෂ හයිය ගතියක් තිබිය යතුයි. නමුත් එහෙම වෙන්නේ නෑ. යම්කිසි වෙලාවක හිතක් පහළ වෙනවද ඒ සිතට සම්බන්ධව තමයි මෝහය පහළ වෙන්නේ. ඒ මෝහය පවතින්නේ එක කෂණයයි. සිත සමග මෝහයද නැතිවී යනවා. ඒකනිසා තමයි අපි කියන්නේ **එකුප්පාදනිරොධා ච, එකාලම්බණවත්ථුකා** කියලා. **එකුප්පාදනිරොධා ච** කියන්නේ එකට උපදිනවා එකට නිරෝධ වෙනවා.

අවිද්‍යාව කර්ම හැදීමට එක එක උදව් උපකාර කරාට අවිද්‍යාවට ඒ තරම් හයියක් නෑ අනිත් ඒවාට නැති විශේෂ බලයක් සහිතව දිගට පවතින්න. එහෙම ධර්මයක් නෑ. ඒක නිසා අවිද්‍යාව තුලත උප්පත්තිය තිබෙනවා - අවිද්‍යාව තුල ජරාව තිබෙනවා - අවිද්‍යාව තුල මරණය තිබෙනවා. ඒක නිසා ජාති ජරා මරණ කියන එක සෑම අංගයක් තුලම තිබෙනවා.

මම මීට ඉස්සෙල්ලා අවුරුදු කීපයකට කලින් මේ පිංවතුන්ට ධර්ම දෙශනාවක් කළා. ඒ ධර්ම දෙශ්නාවේත් මම මේ ගැන මතක් කළා. ධර්මය කියන එක විසාල නිසා නැවත නැවත අහන්න ඕනෑ නැවත නැවත හිතන්න ඕනෑ, නැවත නැවත මෙනෙහි කරන්න ඕනෑ. නැත්නම එහෙම මේවා පටලැවෙනවා.

අපි බලමු දැන් අපිට ලැබිලා තිබෙන දේවල්. අපිට සළායතන තිබෙනවා.

1. චක්ඛු
2. සෝත
3. ඝාණ
4. ජිව්හා
5. කාය
6. මන

} සළායතන

මේ සළායතන තිබුණාට ඒවා වැඩ කරන්න තවත් අවශ්‍යයි නාම රූප. නාම රූප නිසා හැදෙනවා ඵස්ස වේදනා තණ්හා උපාදාන.

නාම රූප } ඵස්ස
වේදනා
තණ්හා
උපාදාන

මේ චක්ඛුව කියන එක ජරා මරණ වලට යටත්වයි පවතින්නේ. ඒක ක්ෂණිකව ඇති වෙනවා - ඇතිවෙනවා කියන්නේ උපදිනවා. ක්ෂණිකව නැති වෙනවා - නැතිවෙනවා කියන්නේ මැරෙනවා. සෝතය කියන එකත් ඇතිවෙනවා කියන්නේ උපදිනවා - කඩා වැටෙනවා කියලා කියන්නේ මැරෙනවා. හැම එකෙනාගේම තිබෙන්නා වූ ඇස් හැදී හැදී මැරි මැරී තමයි තිබෙන්නේ. ඒ කියන්නේ ඉපදී ඉපදී මැරි මැරී තිබෙන්නේ. ඒක නිසා ජාති ජරා මරණ කියන එක මේවා අස්සේ කැවිලා කෙටිලා බැහැලා තිබෙන්නේ. නාම රූප කියන ඒවගෙත් තිබෙනවා ඇති වීම සහ නැති වීම = ජාති ජරා මරණ. ඵස්ස වේදනා තණ්හා උපාදාන කියන ඒවගෙත් තිබෙනවා ජාති ජරා මරණ.

චක්ඛු කියලා කියන්නේ එක්තරා විදියක ධර්ම විශේෂයක්. පඨවි ආපෝ තේජෝ වායෝ කියන්නා වූ ප්‍රධාන රූප මණ්ඩලය ආධාර කරගෙන ඒවාගේ ගැවිලා ඒවා එක්ක රූප වශයෙන් ඉන්න තවත් එකක් තමයි 'චක්ඛුව' කියලා කියන්නේ. නමුත් ඒ පඨවි නොවෙයි. චක්ඛු කියලා කියන්නේ ආපෝ තේජෝ වායෝත් නොවෙයි. ඒ හතර දෙනාට අමතරව ඒ හතර දෙනා ළඟින් තවත් විශේෂිත රූප ධර්මයක් හැටියට තිබෙන එකක් තමයි 'චක්ඛු' කියලා කියන්නේ. 'සෝත' 'ඝාණ' 'ජිව්හා' 'කාය' කියන ඒවත් ඒ වගෙයි. මේවා පඨවිත් නොවෙන ආපෝත් නොවෙන තේජෝත් නොවෙන වායෝත් නොවෙන විශේෂිත රූප ධර්ම. මේවා සියල්ල කර්මයෙන් හට ගන්න උපාදාය රූප.

නමුත් 'මන' කියලා කියන්නේ 'නාම' ධර්මයක්, පඨවි ආපෝ තේජෝ වායෝ නොවෙයි. මේ හැම එකකම තිබෙනවා ඇතිවීමයි නැති වීමයි. ඇතිවීම ජාතියයි - නැතිවීම මරණයයි. මේ පටිච්චසමුප්පාදය කියන එක බලන්න පුළුවන් එක ආයතනයක් හරහා.

අපි හිතමු කෙනෙක් නිවන් දැකීම සඳහා පටිච්චසමුප්පාදයට අනුව ඇස ගැන හිත හිතා ඉන්නවා කියලා. ඇස කියලා කියන්නේ සළායතනයෙන් එකක්. චක්ඛු ආයතනයට පමණක් තනියම වැඩ කරන්න බෑ, විඤ්ඤාණයත් තිබිය යුතුයි. විඤ්ඤාණය = මනායතනය. තවත් ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්ගතා - මනසිකාර - ජීවිත ඉන්ද්‍රිය තිබිය යුතුයි.

ඵස්ස
වේදනා
සංඥා
චේතනා
ඒකග්ගතා
මනසිකාරය
ජීවිත ඉන්ද්‍රිය

→ ←

චක්ඛු ආයතනය
විඤ්ඤාණය = මනායතනය

මේවා එකිනෙක සමග වැඩ කරනවා. මෙහි නාම ධර්මත් තිබෙනවා රූප ධර්මත් තිබෙනවා.

දැන් එයා ඇස ගැන මෙනෙහි කරමින් මෙනෙහි කරමින් අවිද්‍යාවට තිබෙන සම්බන්ධය හොයනවා. විදර්ශනා මනසිකාරයේදී අවිද්‍යාවට ඇති නෑ කම හොයන්නේ ඇස හැදුනේ කුමක් නිසාද කියලා බලනවා. ඇස හැදුනේ කෑම නිසා නොවෙයි. ඇස හැදුනේ weather නිසාත් නොවෙයි. ඇස හැදුනේ අපි ඇසක් හැදෙන්න ඕනෑ කියලා හිතපු නිසාවත් නොවෙයි. ඇස හැදිලා තිබෙන්නේ ඇස හදන්නා වූ ශක්ති විශේෂයකින්. අපි ඒකට කියනවා 'කර්මය' කියලා. ඇස හදන්නා වූ යම්කිසි බල විශේෂයක් යම්කිසි ගුණ විශේෂයක් යම්කිසි ශක්ති විශේෂයක් යම්කිසි හැකියාවක් බලයක් තිබෙන්න ඕනෑ. ඒ හැකියාවෙන් ඒ බලයෙන් ඒ ශක්තියෙන් තමයි ඇස කියන එක හදලා තිබෙන්නේ. ඒ ශක්තියට අපි නමක් දානවා කර්මය කියලා. ඒ කර්මයේ තිබෙන යම්කිසි නිෂ්පාදන හැකියාවක් නිසා තමයි ඕක හදලා තිබෙන්නේ. ඒ නිෂ්පාදන ශක්තියේ ප්‍රතිඵලය (product එක) තමයි ඇස. ඇස ගැන හිතාගෙන යනකොට අපිට තේරෙනවා ඒක හැදිලා තිබෙන්නේ මේ වගේ හැකියාවකින් කියලා.

නමුත් ඇසේ quality බැලුවහම හරි අඩුයි. අඩු පාඩු සහිතයි. චක්ඛු ප්‍රසාදය අඩුපාඩු සහිතයි. මේ ඇස රකින්න ගොඩක් මහන්සි වෙන්න ඕනෑ. ඇස වෙනස් වෙනවා. තුවාල වෙනවා. ඇසේ පෙනීම අඩු වෙනවා. මේවගේ අඩුපාඩු ගොඩයි. ඒවගේම මේ ඇස පිහිටලා තිබෙන්නේ බිත්තරයක් වගේ එකක. මේ වගේ අඩුපාඩු සහිත පරිසරයක පිහිටියාවූ පෙනීම නැති වී යන්නා වූ ඇස් රෝග හැදෙන්නා වූ රැක ගන්න අමාරු ඇසක් හැදුවේ ඒ කර්මයට වෙන තැනක ඇසක් හදන්න හයියක් නැති හින්දා.

අපි ඇසට ලෝභ කරලා කර්ම හදලා තිබෙන නිසා තමයි ඒක ලැබිලා තිබෙන්නේ. නමුත් ඒ ඇස පවතින්නේ අවුරුදු කීපයයි ස්ථිර භාවයකුත් නෑ. සමාන්‍යයෙන් මනුස්සයෙක් වැඩි කාලයක් එනම් අවුරුදු 70 ක් 80 ක් ජීවත් උනත් ඇස අවුරුදු 40 කින් 50 කින් උනත් මැරෙන්න පුළුවන්. මනුස්සයෙකුගේ සම්පූර්ණ ජීවිත කාලය තුල උනත් ඇස පවතින්නේ නැති වෙන්න පුළුවන්. ඒවගේ එකක් තමයි අවිද්‍යාවෙන් හදලා තිබෙන්නේ. ඒක නිසා මේ ඇස කියන product එක නිෂ්පාදනය කරලා තිබෙන්නේ දැනුමක් ඇතුව නොවෙයි.

ඒක තමයි අපිට කණ්ණාඩි දාන්න වෙලා තිබෙන්නේ. මෙහෙම අඩුපාඩු සහිත ඇසක් හදන්න මුල් උනේ අවිද්‍යාව.

ඒක නිසා මේ ගැන මෙනෙහි කරගෙන යනකොට අවිද්‍යාව තිබෙනවා තණ්හාව තිබෙනවා කර්ම තිබෙනවා. ඒක නිසා මේක නිකම්ම ආව එකක් නොවෙයි. දැන් ඔය විසාඛාවගේ චරිතය කියවන කොට ඒකෙ තිබෙනවා ලස්සන ඇස් ලැබෙන්න උස මහත ලැබෙන්න ලස්සන කෙස් ලැබෙන්න කරපු කර්ම. ඒවා ඇහෙනකොට මිනිස්සු ඒවාට ආසා වෙලා මොන මොනවා හරි පූජා කරලා ලස්සන ඇස් කෙස් උස මහත ප්‍රාර්ථනා කරනවා. එතකොට ඒ ඔක්කොම ටික හම්බ වෙනවා නමුත් ඒ හම්බ වෙන්නේ විසාඛාවට වෙච්ච දේත් එක්කයි. විසාඛාවත් වයසට ගියා මැරුණා. ඒ ටික අපිට අමතක වෙනවා. මෙනෙහි කරගෙන යනකොට අපිට හොඳටම පේනවා අපි වරද්දගෙනයි මේක නිෂ්පාදනය කරලා තිබෙන්නේ කියලා. මේ විදියට අවබෝධ උනහම 'මීට පස්සේ අපි ඇසක් හදන්නේ නෑ' කියලා මෙනෙහි කරලා ඇසට තිබෙන්නා වූ ආසාව අයින් කරනවා.

ඒවගේම පටිච්චසමුප්පාදය හොයාගෙන යනකොට චක්ඛු ප්‍රසාදය තිබෙනවා මනායතනය (විඤ්ඤාණය) තිබෙනවා, නාම රූප තිබෙනවා, ඵස්ස - වේදනා - සඤ්ඤා - චේතනා - ඒකග්ගතා - ජීවිතින්ද්‍රිය - මනසිකාර තිබෙනවා. ඊට පිටිපස්සෙන් තිබෙනවා අවිද්‍යාව තණ්හාව සහ කර්මය. මේ ටික හොඳට බලාගෙන යනකොට පේනවා එක වෙලාවේම ඇස හැදෙනවා නැතිවෙනවා කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ස්පර්ශයක් ඇතිවෙලා වේදනාවක් ඇතිවෙනකොට එතැනදී මෝහය ආවේ නැත්නම් තණ්හාවක් ඇති නොවී ඉන්න පුලුවන්ද?

<u>පිළිතුර</u> - මෙහෙමයි තිබෙන්නේ, අපිට සද්දයක් ඇහෙනකොට පංචද්වාරික වශයෙන් ගිහිල්ලා ඒක අහ ගන්නවා. ඊට පස්සේ ඒක හිතේ register වෙනවා. ඊට පස්සේ ඒ සද්දය මොකක්දැයි කියලා දැනගෙන ඊට පස්සේ ඒකට කියන්නා වූ නම දැනගන්නා ඒකෙ අර්ථය දැනගන්නා ක්‍රියා වලියක් සිදු වෙනවා. ඒ සද්දය පිළිබඳව හොඳට හිතට ග්‍රහණය වෙන තෙක් ඒ වගේ චිත්ත වීථි හතරක් පහක් යනවා. මේ චිත්ත වීථි හතර පහ යනකොට ඒ අරමුණ හොඳටම හසු උනොත් නොතේරුම් කම මුල් වෙලා පස් වෙනි චිත්ත වීථියේදී තමයි කර්ම පථ බවට පත්වෙන්නේ. එහෙම නැතුව ඉස්සෙල්ලා යන සිත් අපිට නවත්වන්න බෑ. ඒවා චිත්ත නියාමයට අනුව සිද්ධ වෙනවා. ඒක රහතන්වහන්සේටත් සිද්ධ වෙනවා.

අහපු සද්දය register වෙන එක - ඊට පස්සේ ඒක මොකක්ද කියලා විපරම් කරන එක - ඒකෙන් කියන නම - අර්ථය ඔක්කොම ඉස්සෙල්ලා යනවා. සිහිය නුවණ දියුණු කරලා තිබෙනවා නම් ඒක ඇහෙනකොටම යෝනිසෝ මනසිකාරය පහළ වෙනවා. ඒකට කලින් පුරුදු කරලා තිබෙන්න ඕනෑ. ඒ පුරුදු කරන එකට පිහිටක් ලැබීමට තමයි අපි මේ වගේ බණ දේශනාවල් කියලා දෙන්නේ. මේවා කඩලා කඩලා බැලුවට පස්සේ ඇත්ත වශයෙන්ම අපිට හොඳට හිතන්න පුළුවන් සිතුවිල්ලක් හැදෙනවා. **භාවනාව කියන එක වෙන්නේ නෑ, භාවනාව කරන්න ඕනෑ.**

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස යෝනිසෝ මනසිකාරයෙන් බලලා කර්ම පථයක් වෙන්න නොදී එහෙම කරන්නේ ඒකෙ ආදීනව බලලද?

<u>පිළිතුර</u> - නෑ, එහෙම දිගට යන්න හොඳ නෑ. ඇත්ත වශයෙන්ම අපි සිහියෙන් නුවණින් ඉන්නකොට අපිට අමුතුවෙන් හිතන්න දෙයක් නෑ. සිහිය නුවණ පවත්වාගෙන යනකොට අපි සිහියෙන් නුවණින් රූප දකිනවා සද්ද අහනවා ගඳ සුවඳ දැනගන්නවා. එතකොට auto ඒක සිද්ධ වෙනවා. සිහිය නුවණ පවත්වනකොට, ඉස්සෙල්ලා සද්දය ඇහෙනවා හෝ රූපය පේනවා. ඊට පස්සේ අර පෙර කිවූ ක්‍රියාවලිය වෙනවා. ඒ ඇහෙන දේ හෝ පෙනෙන දේ මේකයි කියලා යෝනිසෝ මනසිකාරයෙන් මෙනෙහි වීම සිද්ධ වෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඉස්සෙල්ලා ඔබ වහන්සේ කිව්වා පටිච්චසමුප්පාදයට අනුව අවිද්‍යාවත් සංඛාරත් නිසා තමයි විඤ්ඤාණ නාම රූප සළායතන ඇති වෙන්නේ, ඒ වගේම තණ්හා උපාදන භව වලටත් අවිද්‍යා සංඛාර බලපානවා කියලා කිව්වා. එතකොට ඵස්ස සහ වේදනාවටත් අපේ පරණ කර්ම හේතු වෙනවා නේද? මගේ සිතට වේදනා දෙන්නාවූ රූපයක් දකින්න මගේ පෙර කර්මයක බලපෑමක් වෙන්නේ නැත්ද?

<u>පිළිතුර</u> - ඒක වෙන්නේ මෙහෙමයි. දැන් මහත්තයාට තිබෙන ප්‍රශ්නය තමයි ඵස්සය සහ වේදනාව පෙර කරපු කර්මය නිසාමද ඇති වෙන්නේ කියන ප්‍රශ්නය. විශේෂයෙන්ම වේදනාව.

සෑම සිතකම යෙදෙන සර්ව චිත්ත සාධාරණ කියලා චෛතසික ධර්ම හතක් තිබෙනවා. ඒ තමයි 'ඵස්ස - වේදනා - සඤ්ඤා - චේතනා - ඒකග්ගතා - ජීවිතින්ද්‍රිය - මනසිකාර'. දැන් මෙතන තිබෙනවා වේදනාව. මේ චෛතසිකවලට සර්ව චිත්ත සාධාරණ කියලා කිව්වේ හැම සිතකම තිබෙන නිසා. මේ චෛතසික හත රහතන්වහන්සේලාගේ සිත් වලත් පහළ වෙනවා, පිං කරන කොටත් පහළ වෙනවා, පවු කරන කොටත් පහළ වෙනවා, විපාක සිත්වලත් තිබෙනවා, ක්‍රියා සිත් වලත් තිබෙනවා.

මේ චෛතසික විපාක සිත් වල තිබෙන වෙලාවට ඒක විපාකයක්. කර්ම සිත් වල තිබෙනවා නම් ඒක කර්මයක්. අපි මල් පූජා කරනවා එතකොට ඒක කර්මයක් මිසක විපාකයක් නොවෙයි. මල් පූජා කරන සිතෙත් වේදනාව තිබෙනවා නම් ඒ වෙලාවට ඒ වේදනාව කර්මයක් මිස විපාකයක් නොවෙයි, ඉස්සරහට දෙන විපාකයක් හදන එකක්. ඒක නිසා 'වේදනාව' කියන එක පෙර කරපු කර්මයක විපාකයක්ම නොවෙයි. රහතන්වහන්සේටත් එහෙමයි. රහතන්වහන්සේගේ සිතෙත් වේදනාව තිබෙනවා. ඒක කර්ම නොවෙයි ඒවා ක්‍රියා සිත්. 'වේදනාව' විපාක වෙන අවස්ථාත් තිබෙනවා නොවෙන අවස්ථාත් තිබෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඇසට රූපයක් කවදාකවත් හම්බ වෙන්නේ නෑ. ඇසට හම්බවෙන්නේ වර්ණය විතරයි. අපි මනසින් රූපයක් හදාගන්නවා. එතැනදී ඒක කොහොමද අපි විපස්සනා කරන්නේ?

<u>පිළිතුර</u> - ඇත්තටම චක්ඛු ප්‍රසාදය හරහා රූපයක් අපිට හමුවෙනවා. ඒක නැත්තේ නෑ. ඒක පැහැදිලිවම සූත්‍ර දේශනාවල තිබෙනවා, ‘වර්ණ රූපයයි’ ‘චක්ඛු ප්‍රසාදයයි’ ‘විඤ්ඤාණයයි’ සංඝටනයි ‘ඵස්සය’ කියන්නේ කියලා. එතකොට තුන්දෙනෙක් අවශ්‍යයයි. ඒ කියන්නේ බාහිර වර්ණයකුයි චක්ඛු ප්‍රසාදයයි විඤ්ඤාණයයි. ඒ තුන්දෙනා හමුවෙන්නේ චක්ඛු ප්‍රසාදයේ කියන එක වෙන එකක්, නමුත් ඒ චක්ඛු ප්‍රසාදයට වැටෙන්නා වූ දේ වැටෙන්නේ බාහිර දෙයක් තිබෙන නිසා. දැන් අපි කණ්ණාඩියක් ඉස්සරහට ගියහම කණ්ණාඩිය ඇතුලේ රූපයක් තිබෙනවා. එහෙම කණ්ණාඩිය ඇතුලේ රූපයක් පෙනෙන්න නම් කණ්ණාඩිය ඉස්සරහ ඉන්න ඕනෑ. අපි කණ්ණාඩිය ඉස්සරහ හිට ගත්තොත් තමයි රූපයක් කණ්ණාඩියේ වැටෙන්නේ. ආන්න ඒ වගේ ඉස්සරහ රූපයක් තිබුනොත් තමයි ඒක ඇසට වැටෙන්නේ. ඒක වර්ණ රූපයක් බව ඇත්ත. නමුත් ඒ වර්ණ රූපයට අපි ඇතුලතින් සංකල්ප එක්කාසු කරනවා. **සඞ්කප්පරාගො පුරිසස්ස කාමො - සඞ්කප්පරාගො පුරිසස්ස කාමො** කියලා කියන්නේ අපි ඒ වර්ණයටම නොවෙයි ආස කරන්නේ. ඒ වර්ණයට අපි වද්දලා තිබෙන්නා වූ සංකල්පයටයි ආසා කරන්නේ. කෙලෙස් හැදෙන්නේ ඇතුලතින් හදලා පිටට දාලා අපි ඒකම ගන්න හින්දයි.

ඒක හරියට කියනවානම් අපි ඔය වලාකුළු දිහා බලාගෙන ඉන්නකොට ඒ වලාකුළු හාවෙක් වගෙත් පේනවා. අශ්වයෙක් වගෙත් පේනවා. දිව්‍යාංගනාවන් වගෙත් පේනවා. පරණ කථාවක් තිබෙනවා හඳේ හාවෙක් ඇන්දා කියලා . ඒ කථාව අහගෙන ගිහිල්ලා හඳ දිහා බැලුවාම හාවෙක් ඉන්නවා. ඇත්තටම ඒ හාවා කියන සංඥාව වද්දන්නේ අපි මෙහෙ ඉඳලා. වලාකුළු වලටත් ඒ වගේ සංඥාවල් අපි වද්දනවා.

ඇමරිකාවේ Twin Towers ගිනි ගන්නකොට එක්කෙනෙක් ගිහිල්ලා ෆොටෝ අරගෙන තිබෙනවා. එයින් එක ෆොටෝ එකක තිබෙනවා භූත රූපයක්. ඒ කියන්නේ එක්තරා යක්ෂ රූපයක් විදියට දුම් රටාවක් ඇවිල්ලා තිබෙනවා. එයා ඊට පස්සේ ඒකට මහා යක්ෂයෙක් කියලා සංකල්පයකුත් දෙන්න උත්සාහ කළා. ඇත්ත වශයෙන්ම ඒක දුමේ තිබෙන දෙයක් නොවෙයි. ඒක හිතින් දෙන එකක්. නමුත් එහෙම සංකල්ප දෙන්න හොඳ නෑ. අපි අදහසක් දීලා, සංකල්පයක් ගොනු කරලා, සංකල්පයක් ඒ රූපයට වද්දලා ඊට පස්සේ අපිම ඒ දීපු එකට ඇලෙනවා.

ඒකට කියන්නේ **‘න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ - සඞ්කප්පරාගො පුරිසස්ස කාමො’** = බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ඔය තිබෙන රූපවල ලස්සන බවක් හෝ අවලස්සන බවක් නෑ. ඒවා එහෙමම තිබෙනවා. අපි ඒවාට යම්කිසි අදහසක් ගන්වලා තමයි ඒක නැවත ගන්නේ.

අපි කියනවා මිනිස්සු හරි ලස්සනයි කියලා. මිනිස්සු හරි ලස්සනයි කියලා අපි කරන්නේ අගයන් වටිනාකම් සංකල්පයන් නිර්මාණය කරනවා. නිර්මාණය කරලා අපි ඒක ඒ රූපයට වද්දනවා. ඊට පස්සේ අපි ඒක තමයි හොඳයි කියලා absorb කරන්නේ. ඒක අපි කරනවා නේද කියලා සිහියෙන් නුවණින් බලන්න ඕනෑ. එතකොට තමයි අපේ යෝනිසෝ මනසිකාරය අවධි වෙලා එන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි පිටින් දාගත්තු හදාගත්තු එක තමයි සංකල්පය. එතකොට විදර්ශනා කරන්න තිබෙන්නේ ඒකද?

<u>පිළිතුර</u> - ධර්ම දිහා බලන ක්‍රම ගොඩක් තිබෙනවා. එක විදියකට මෙනෙහි කරනවා 'මේ මම දාපු දේ නේද බලන්නේ' කියලා. ඊට පස්සේ මේක හැදුනේ කුමක් නිසාද කියලා 'අවිද්‍යාව' 'තණ්හාව' 'කර්මය' නිසා නේද කියලා ප්‍රත්‍යය වශයෙන් බලනවා. ඊට පස්සේ ඒකෙ ඇතිවීම නැතිවීම වශයෙන් බැලීම උප්පාද ක්‍ෂණය බැලීමක්. ඒක නිසා එකම ක්‍රමයක් නොවෙයි තිබෙන්නේ. අපි තෝරා ගන්න ඕනෑ අපි මොන angle එකෙන්ද යන්නේ කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එක විදියකට පමණක් බලන්න පුලුවන්ද?

<u>පිළිතුර</u> - ප්‍රත්‍යය වශයෙන් බලන්නත් ඕනෑ. ඇතිවීම නැතිවීම හැටියට බලන්නත් ඕනෑ ලක්ෂණ වශයෙන්. ඒවගේම දකින බලන දේවල් වලට අපි සංකල්ප හදන විදිය කෙලෙස් ගැට ගැහෙන විදිය බලන්නත් ඕනෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පෙනෙන දේ ඒ වෙලාවේම ඇති වෙලා නැතිවෙලා යනවා. ඊට පස්සේ අපි ඇතුලට ගත්ත දේ තමයි දැන ගන්නේ. ඇතුලට ගත්තු එකේ උදය වයද අපි බලන්න ඕනෑ?

<u>පිළිතුර</u> - බාහිර දේත් උදය වය බලන්න ඕනෑ, ඇතුලට ගත්ත දේත් උදය වය බලන්න ඕනෑ. උදය වය බලනකොට ඔය හැදෙන ඒවා නවතිනවා. බාහිර වශයෙන් මනසිකාරය කරන්න ඕනෑ - ආධ්‍යාත්මික වශයෙන් මනසිකාරය කරන්න ඕනෑ - හිතේ හැටි බලන්නත් ඕනෑ - යථාර්තය බලන්නත් ඕනෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතැන හිතේ හැටි බලන්න ඕනෑ කිව්වහම හිතට ආසාවක් හරි තරහක් හරි අවාහම ඒක ඇති උනේ කොහොමද කියලද බලන්නේ?

<u>පිළිතුර</u> - ඔව් ඒක හැදුන හැටි බලන්නත් පුළුවන්. 'මොකක් නිසාද මේක ඇති උනේ. මම නොමනා විදියට බලපු නිසා නේද' කියලා බලන්න පුළුවන්. බුදුරජාණන්වහන්සේ විතක්කසණ්ඨාන සූත්‍රයේත් දේශනා කරනවා බලන ක්‍රම පහක්.

ඇතිවීම නැතිවීම බලන එක ක්‍ෂණික වශයෙන් බලනවා. සන්තති වශයෙන් බලනවා. සන්තති වශයෙන් බලනවා කියලා කියන්නේ ඔය අපි කිව්වට එක එක්කෙනාගේ බලන්න පුළුවන් හැකියාවල්, එක එක්කෙනාට බලන්න පුළුවන් අනිත්‍ය වෙලා යන වේග ගති එක සමාන වෙන්නේ නෑ. අපිට ඒක කියන්න පුළුවන්. හැබැයි බලන එක ඒ තරම් වේගයෙන් බලන්න බෑ. ඒක නිසා පුළුවන් විදියක් තිබෙනවා. ඒ ක්‍ෂණය බලන්න බැරි උනාට දවස දවස බලන්න පුළුවන්. එහෙම බලන්න පුළුවන් උනහම වරුව වරුව බලන්න පුළුවන්. ඊළඟට රෑ දවල් වශයෙන් බලන්න පුළුවන්. ඊට පස්සේ ඉස්සරවෙලා පැයේ ස්වභාවය සහ දැන් පැයේ ස්වභාවය බලන්න පුළුවන්. මෙහෙම පොඩියට පොඩියට කඩලා බලන්න

පුළුවන් උනහම විනාඩි පහෙන් පහට, ඊට පස්සේ විනාඩියෙන් විනාඩියට බලන්න පුළුවන්. මේ බලනවා කියන එක ගැන 'කීමයි' 'බැලීමයි' වෙනස්. ඒක ලේසි නෑ. ක්ෂණිකව බලන එක තමයි හොඳ නමුත් ඉස්සෙල්ලා සන්තති වශයෙන් බලලා හුරු වෙන්න ඕනෑ. සන්තති කියලා කියන්නේ කාණ්ඩ කාණ්ඩ. ඇත්තටම භාවනා කරන කෙනෙකුට ක්ෂණික කියලා කිව්වට පෙන්නේ සන්තතියක්.

මෙහෙම එකක් තිබෙනවා - අපේ වැඩිහිටි ස්වාමීන්වහන්සේ නමකගේ තාත්තා වෙද මහත්තයෙක්. ඒක නිසා ඒ ස්වාමීන්වහන්සේට යම් යම් බෙහෙත් හේත් කරගන්න පුළුවන්. අනිත් අයටත් පොඩි පොඩි බෙහෙත් දෙනවා. ඒ ස්වාමීන්වහන්සේත් බෙහෙත් හදාගන්නවා. තාත්තා වෙදමහත්තයා නිසා ඒ ස්වාමීන්වහන්සේටත් තාත්තාගේ ගතිය බලපාල තිබෙනවා. ඒවගේම ඒ ස්වාමීන්වහන්සේගේ දායක කීපදෙනෙක් ඉන්නවා. ඒ අයත් වෙද පවුල්වල අය. ඒ අයත් සමගත් යම් යම් බෙහෙත් ගැන සාකච්ඡා කරනවා. මාවනැල්ල පැත්තේ තවත් ප්‍රසිද්ධ වෙද මහත්මයෙක් හිටියා. එයත් මේ ස්වාමීන්වහන්සේ අඳුරනවා. එතකොට දැන් තාත්තත් වෙද මහත්මයෙක් ඒ ස්වාමීන්වහන්සේටත් ටිකක් වෙදකම් කරන්න පුළුවන්. දායක මහත්වරුත් ඉන්නවා වෙද පවුල්වල. ඒවගේම බෙහෙත් කඩයක් තිබෙන්නා වූ දායක පවුලකුත් හිටියා.

මේ ස්වාමීන්වහන්සේට අසනීප උනා. මේක මම දන්න එකක්. ඒ ස්වාමීන්වහන්සේට මට උපස්ථාන කරන්න සිද්ධ උනා. අසනීප වෙලා මේ ස්වාමීන්වහන්සේ ඉස්පිරිතාලේ ගිහිල්ලා නැවතුනා. දොස්තර මහත්මයෙක් ඒ ස්වාමීන්වහන්සේට වෙදකම් කළා. තව විශේෂඥ දොස්තර මහත්මයෙකුත් වෙදකම් කළා. ඔය අතර වාරෙයදී ඒ ස්වාමීන්වහන්සේ ටිකට් කපාගෙන ඇවිල්ලා අර බෙහෙත් බොන ගමන් තමන් දන්නා බෙහෙතකුත් හදාගත්තා. දායක කඩෙන් බෙහෙත් ගෙනල්ලා ඒවත් හදා ගත්තා. ඊට පස්සේ මාවනැල්ලේ වෙද මහත්තයත් හම්බ වෙන්න ගිහිල්ලා ඔකොම විස්තර කිව්වා. ඒ වෙද මහත්මයාත් බෙහෙත් කීපයක් දුන්නා. දැන් මාස කීපයක් ඕවා කළා. අවසානයේදී ඒ වෙද මහත්මයා කිව්වා ස්වාමීන්වහන්ස මම වැඳලා කියන්නම් ඔබවහන්සේ මේ පැත්ත පළාතේ ආයිමත් එන්න එපා කියලා.

හේතුව මේ බෙහෙත් විතරක් නොවෙයි ඉංග්‍රීසි බෙහෙතුත් බොනවා විශේෂඥ වෛද්‍යවරයා දෙන බෙහෙතුත් බොනවා කඩෙනුත් අරගෙන බොනවා තාත්තා කියපු ඒවත් බොනවා තමන් හදාගෙනත් බොනවා. ඒක තේරුම් අරගෙන 'අනේ ස්වාමීන්වහන්ස පිං සිද්ධ වෙයි ආයිමත් මෙහෙ වඩින්න එපා' කියලා ඒ වෙද මහත්මයා කිව්වා.

මට කියන්න තිබෙන්නේත් ඒ වෙද මහත්මයා කිව්වා ටිකම තමයි. Internet එකෙනුත් බණ අහනවා. මගෙනුත් අහනවා. පොතෙනුත් බලනවා. ලංකාවේ තියෙන ඒවත් බලනවා. ඔක්කොම බණ තමයි. ඊට පස්සේ තමනුත් ඒවාට අදහස් දෙනවා. සමහර අය මගෙන් අහලත් තිබෙනවා ඒ අය සෝවාන් වෙලා සෝවාන් ඵල සමාධියට පත් වෙනවා නමුත් ඒකෙ දිගට ඉන්න බෑ කියලා ඒකට මගෙන් බෙහෙත් ඉල්ලනවා. මම ඉතින් අහනවා ඵල සමාපත්ති කියන්නේ මොනවාද කියලා. කොච්චර වෙලාවක් හිටියද කියලා. එතකොට කියනවා විනාඩි පහෙන් පහට නැතිවෙනවා කියලා ඔහොම ඒවා කියනවා. අනිත් එක

තමයි එල සමාධියකට පත්වෙන්න පුළුවන් නම් මොකටද මම ගාවට එන්නේ. විනාඩි පහක් නොවෙයි එක තත්පරයක් එල ස්මපත්තියක ඉන්න පුළුවන් නම් ඒක කොච්චර වටිනවද.

ඒක නිසා පිළිවෙලකට එක විදියකට යන්න ඕනෑ. සමාධි තිබෙනවා, ඒවා කියලා දෙනවා. විපස්සනා තිබෙනවා, ඒවා කියලා දෙනවා. යෝනිසෝමනසිකාරය තිබෙනවා, ඒවා කියලා දෙනවා. නමුත් හැම තැනිකම ගිහිල්ලා ඔලුව අවුල් කරගන්න හොඳ නෑ.

<u>ප්‍රශ්නය</u> - අපි හැම දෙයක් දෙසම බලන්නේ ඉස්සෙල්ලා ගත්ත එකකට සාපේක්ෂව. නමුත් සමහර විටක සමාධියක් නැතුව උනත් ඇත්ත මේකයි කියලා තේරෙනවා. එතකොට එහෙම අපිට ඇතිවෙන අදහසයි භාවනාවේදී සම්බන්ධ කරලා බලන එකෙයි ලොකු වෙනසක් තිබෙනවද?

<u>පිළිතුර</u> - තිබෙනවා. තිබෙනවා කියලා කියන්නේ මෙහෙමයි. ඥාන තුනක් තිබෙනවා. එකක් තමයි සුතමය ඥානය. අනිත් එක තමයි චින්තාමය ඥානය. අනිත් එක තමයි භාවනාමය ඥානය. සුතමය ඥානයෙන් බණ අහන කොට අපි ඒක තේරුම් ගන්නේ හිතෙන් බණ සංකල්පනා හදමින්. අපි නිවන් ගැන කියනවා, බ්‍රහ්මලෝක ගැන කියනවා, දිව්‍යලෝක ගැන කියනවා. එතකොට ඒ ලෝක ගැන සංකල්ප හැදෙනවා. නිවන් සංකල්ප හැදෙනවා. ඒ නිවන ප්‍රත්‍යක්ෂ නිවනක් නොවෙයි. නමුත් 'මේක කරහම වෙන්නේ මේකයි' කියලා හිතේ පින්තූර හැදෙනවා. ඒක නොවී ඉන්නේ නෑ. ඒක තිබෙනවා. අහන කොටත් එහෙමයි, අහපු ඒවා මෙනෙහි කරන කොටත් එහෙමයි. නමුත් ප්‍රත්‍යක්ෂයට යනකොට සියුම් තැන් ස්පර්ශ වෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ජේනවා කියන එකෙන් අදහස් කරන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - ඇත්ත වශයෙන්ම හිතට ජේනවා කියන එකෙන් කියන්නේ නුවණට වැටහෙනවා කියන එකයි.

තව එකක් තමයි අපිට පුළුවන් සංකල්ප හදලා අනිත් එක්කෙනාගේ සිතේ ඒක paint කරන්න. ඒකෙන් අදහස් කරන්නේ තමන්ගේ අදහස අනිත් එක්කෙනාගේ හිතේ බෝ කරනවා, ඒ අදහස අනිත් එක්කෙනාගේ හිතේ පැල කරනවා. අනිත් එක්කෙනාගේ සිතේ ඒක මතු වෙන්න වැඩ හදනවා. ඒක නිසා අපි ඉස්සෙල්ලාම හදාගන්නවා සම්බන්ධතාවයක්. එක හරියට counsellor සහ client අතර තිබෙන සම්බන්ධය වගේ. Counselling කරනකොට ඉස්සෙලා counsellor සහ client අතර විස්වාසයක් හදනවා. එහෙම විස්වාසයක් හදාගත්තට පස්සේ counsellor කරන්නේ clientගේ හිතට අදහස් බෝ කරනවා. විශේෂයෙන්ම counsellor සහ client අතර relationship එක strong විදියට තිබෙන්න ඕනෑ. නැත්නම් ඒක කරන්න බෑ. ඒ සම්බන්ධය හොඳට හදා ගත්තට පස්සේ තමයි තමන්ගේ අදහස් පැල කරන්නේ. ඒකට මම පාවිච්චි කරපු වචනය තමයි paint කරනවා කියන එක. අපි හද හදා අනිත් එක්කෙනාගේ හිතේ ඒවා පැල කරනවා, මවා පානවා. එයා ඒවා භාර ගන්නවා relationship එක බලවත් නිසා.

මේවා කියන්න හොඳ නෑ, නමුත් මම එක්තරා සීමාවක කියන්නම් ඔක්කොම කියන්නේ නැතුව. මම guidance එකක් යටතේ කීප දෙනෙක් hypnotize කළා. Hypnotize කරනකොට අමාරුම වෙච්ච දේ තමයි bridge එක හදා ගැනීම. නමුත් එක තැනකට ආවට එයා පස්සේ අපි කියන හැටියට යනවා. ඒවගේ තමයි කෙනෙක් හිතා ගත්තොත් සෝවාන් කියලා කියන්නේ මෙන්න මෙහෙම එකක්. අරූපාවර ධ්‍යානය කියලා කියන්නේ මෙන්න මෙහෙම එකක්, ප්‍රථම ධ්‍යානය කියලා කියන්නේ මෙන්න මෙහෙම එකක් කියලා ප්‍රයෝගිකව නැතුව මම හිතින් හිතාගෙන අනිත් එක්කෙනාට ඒ අදහස් ටික කියපු ගමන්ම ඒ අය ඒක ගන්නවා. ඊට පස්සේ එයා ඒ අදහසේ ඉන්නවා.

ඒක පුද්ගලික විස්වාසය මත සිදුවෙන දෙයක්. ඒකට තමයි කියන්නේ counsellor - client relationship එක කියලා.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස දැන් අපි internet එකෙන් බණ අහන කොට තමන්ගේ දැනුමෙන් ලබාගත්තු දෙයක් නිසා මම හිතපු දේ තමයි මේ කියන්නේ කියලා ඒක ගන්න විදියක් තිබෙනවා.

<u>ස්වාමීන්වහන්සේ</u> - එහෙමත් තිබෙනවා. අපි කරන්නේ බුදුරජාණන්වහන්සේ දේශනා කරපු ධර්ම නියායේ පිහිටලා ඒක විනාස කරන්නේ නැතුව ධර්ම ස්වරූපය විතරක් කියලා දෙනවා. ධර්මයේ තිබෙන්නාවූ individual characteristics කියලා දෙනකොට ඒක තමයි reality එක. ඒකට ගැලපෙන මානසිකත්වයක් තිබුනොත් ඒක apply වෙනවා නැත්නම් අතහැරෙනවා. සමහර කෙනෙක් ධර්මයට එනකොට යම්කිසි දේවල් හිතේ හදාගෙන එනවා. එතකොට මේ විස්තරයයි ඒකයි දෙකක් වෙනවා. එතකොට applicable නෑ.

බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ **යො ධම්මං පස්සති සො මං පස්සති** කියලා. අපිට බුදුරජාණන් වහන්සේ මෙහෙමයි කියල පෙන්නන්න බෑ. බුදුරජාණන්වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්තයි කියලා එහෙම කියලා දෙන්න බෑ, පින්තූර නැති නිසා. සමහර විට පිළිමවහන්සේ නමක් පෙන්නලා ඡායාරූප මවන්න පුළුවන්. නමුත් ඒක බුදුරජාණන්වහන්සේ ධර්මය තුලින් දැකීමක් නොවෙයි. බුදුරජාණන් වහන්සේම දේශනා කරලා තිබෙනවා ධර්මය කියලා දෙන්න කියලා. ධර්ම ස්වරූප කියලා දෙන්න. අනිත්‍ය දුක්ඛ අනාත්මය තිබෙන තැන තිබෙන දේවල් කියලා දෙන්න කියලා. ඒවා කියලා දෙනකොට ගැලපෙන හිත තිබෙන එක්කෙනා ධර්මයට එනවා. ධර්මයට ඇවිල්ලා ධර්මය තුලින් එයා බුදුරජාණන්වහන්සේ දකිනවා. එතකොට මට පෙන්නන්න දෙයක් නෑ. යො ධම්මං පස්සති සො මං පස්සති - අපි බුදුරජාණන් වහන්සේ පෙන්නන්නේ නෑ. අපි පෙන්නනේ ධර්මය. ධර්මයට ගිය ගමන් බුදුරජාණන්වහන්සේ පේනවා.

ඊට වඩා වෙනස්, විස්වාසය මත චිත්තරූප මැවීම. දැන් අපි මේ කිසි කෙනෙකුගේ සිත් වල අමුතු විදියේ soothing චිත්ත රූප මවන්නේ නෑ. එහෙම මවන්නේ නැත්තේ ධර්මය ප්‍රායෝගිකව කරගෙන යනකොට එක එක්කෙනාගේ ධර්ම දියුණුව හැදෙනකොට ඒක

සිද්ධ වේවි. මට හදන්න දෙයක් නෑ. ඒක reality එකක්. ඒක තමයි නියම ධර්මය. අර මවා පාන එක හරි භයානකයි.

අපි හිතමු මම යම්කිසි විදියකින් මවනවා අරූපාවචර ධ්‍යානය. ආකාසානඤ්චායතන මෙහෙමයි විඤ්ඤාණඤ්චායතනය මෙහෙමයි දැන් මොකක්වත් දැනෙන්නේ නෑ කියලා කිච්චහම විස්වාසය මත ඒ සංකල්ප තමන් තුල හදාගන්නවා. යම්කිසි දවසක මාත් එක්ක පොඩි අමනාපයක් වෙච්ච ගමන් එයා ධ්‍යානය අයින්කරනවා. ඒ විස්වාසය මත ඇතිකරගත්තු එකක් නිසා. දැන් ඔය සෝවාන් වූ අයත් ඒවා අතහැර දාල එන හේතුව ඒකයි. විස්වාසය මත හිතේ මවාපාපු දේවල් මත ගියා. යම්කිසි වරදක් වෙච්ච ගමන් අත්හැරලා දාල එනවා. සමහර විට හතර පස් දෙනෙක් එකතුවෙලා එකවිට කිච්චොත් ඕක මුලාවක් කියලා එතකොටත් අතහරිනවා. එතකොට relationship එක දූර්වල වෙනවා. ඒක නිසා අතහරිනවා. නමුත් ධර්මය දැකලා තිබුණා නම් ඒක වෙන්නේ නෑ.

<u>අදහසක්</u> - ස්වාමීන්වහන්ස සූත්‍ර දේශනා 50 ක් වත් අහලා තිබෙන එක්කනෙක් රවට්ටන්න බෑ.

<u>ස්වාමීන්වහන්සේ</u> - මෙහෙමයි තිබෙන්නේ, ශ්‍රද්ධාවයි ප්‍රඥාවයි තිබෙනවා නම් ධර්ම කරුණු හොඳට වැටහිලා තියෙනවා නම් පමණයි මුලා නොවෙන්නේ. නැත්නම් සූත්‍ර ධර්ම ගොඩක් අහපු කට්ටියත් මුලා වෙලා තිබෙනවා. 50 ද 100 ද 200 ද කියන එක නොවෙයි ධර්ම කාරණය වැටහීමයි වටින්නේ. ධර්ම කාරණය වැටහෙනවා නම් ඒ අය මුලා වෙන්නේ නෑ.

බුදුරජාණන්වහන්සේගේ කාලෙදීත් ඕක උනා. සමහර අය බුද්ධ සාසනයෙන් අයින් වෙලා තුනුරුවන් අත්හැරලා දාලා ගියා. ගිහිල්ලා නැවත ආපු අයත් හිටියා. බුද්ධ කාලෙත් එකට සේනාසනයේ හිටපු අයත් බුදුරජාණන් වහන්සේගේ පිටිපස්සෙන් පිණ්ඩපාතේ වැඩිය අයටත් එහෙම උනානම් අනිත් අයට නොවෙයි කියලා කියන්න බෑ. හැබැයි තුනුරුවන් අත්හැරලා දාල තීර්ථක ආරම වලට ගිහිල්ලා අපහු එන එක්කෙනා බාර ගන්න එපා කියල නම් බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස දේවදත්ත හාමුරුදුරුවන්ගේ කාණ්ඩායම හැර තවත් ඒ වගේ බුදුදහම පිළිබඳ වෙනස් අදහස් දරපු කණ්ඩායම් හිටියද?

<u>පිළිතුර</u> - එක එක අදහස් තුබුන අය හිටියා නමුත් ලොකුවට නොවෙයි. ඒවා බුදුරජාණන්වහන්සේ ලඟට ප්‍රශ්න කිරීම් වශයෙන් ඇවිල්ලා සුද්ධ කර ගත්තා. එහෙම භික්ෂූන් වහන්සේලා හිටියා. බුදුරජාණන් වහන්සේ දේශනා කරපු දේශනාවල්වල පොඩි කාරණාවල් තදින් ගත්ත අයත් හිටියා. කොසඹෑනුවර ප්‍රශ්නය ඇති වෙන්න හේතුවත් ඒකයි. භික්ෂූන් වහන්සේලා අතර උනත් සමහර දේවල් දෘෂ්ඨි වශයෙන් තදින් ගත්ත අය හිටියා. නමුත් ඒ කාලේ භික්ෂූන් වහන්සේලාත් එක්ක එකට ඉඳලා බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කරලා ගිය අයත් හිටියා. සමහර අය බුදුරජාණන් වහන්සේගෙන් තර්ජනාත්මකව අහලත් තිබෙනවා ‘මට මේක කියලා දුන්නේ නැත්නම් මම යනවා’ කියලා. එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කළා ‘යන එක නොයන එක තමන්ගේ

වැඩක්. මම කවදාකවත් කියලා තියෙනවද මේක විස්තර කියලා දෙන්නම් මහණ වෙන්න කියලා''.

අනිත් එක තමයි බුදුරජාණන් වහන්සේ යන එක්කෙනා නැවැත්තුවෙත් නෑ. එන එක්කෙනා වැලැක්කුවෙත් නෑ. බුදුරජාණන් වහන්සේට එක අදහසක් තිබිලා තිබෙනවා, ඒක පරිනිර්වාණ සූත්‍රයේ තිබෙන්නේ. කව්දාකවත් තථාගතයන් වහන්සේට අදහසක් ආවේ නැතිලු 'මම මේ සඝ පිරිසක් පාලනය කරගෙන leader කෙනෙක් හැටියට ඉන්න ඕනෑ' කියලා. අනිත් එක තමයි 'මේ අය මගේ ශ්‍රාවකයෝ හැටියට ඉන්න ඕනෑ' කියලා එහෙම අදහසක් ඇවිල්ලත් නැතිලු. ධර්මය කියලා දුන්නා නිවන් අවබෝධ කරගන්න ඒකෙ පිහිටෙව්වා සංඝයා එච්චරයි. ඒවගේ අපිත් යන එක්කෙනා නවත්වන්න හොඳ නෑ. එතකොට ඒ අය හිතනවා අපි ඉන්නේ ඒ අය හින්ද කියලා. නමුත් එහෙම එකක් නෑ.

ඔය වගේ මෝඩ අදහසක් ගැන මට දැනගන්න ලැබුණා. සමහර අය හිතනවා ජිනාලංකාර හාමුදුරුවෝ දුක් වෙනවා ඇති අපි ගිය හින්දා කියලා. හිතලා බලන්න මගේ ජීවිතේට හිටපු ළඟම නෑදෑයා තමයි අම්මයි තාත්තයි. ඊළඟට සහෝදර සහෝදරියෝ. ඊළඟට අපිට උගන්වපු ගුරුවරු. ඒ ගුරුවරුත් අම්මයි තාත්තයි දෙන්නත් නැති උනා. අම්මයි තාත්තයි දෙන්නා ජීවත් වෙලා ඉන්දෙද්දීම තමයි අත්හැරලා දුරු වෙලා ආවේ. සහෝදර සහෝදරියොත් අත හැරලා දුරු වෙලා ආවා. අපිට උගන්නපු ගුරුවරුත් අපි අත හැරලා මේ රට වලට ආව. මෙහෙම ළඟින්ම හිටපු අයත් අත්හැරලා දාලා ආවානම් මේ කොහේවත් යන අම්මලා ටිකක් ගියාට පස්සේ දුක් වෙනවා නම් ඒක මොන විහිළුවක්ද. කිසිකෙනෙක් ගියාට එහෙම දුක් වෙන එක්කෙනක් නොවෙයි මම. එහෙම දුකවෙන්න කිසිම හේතුවක් නෑ. මට එහෙම විශේෂිත බැඳීමක් නෑ. අනිත් එක අපි නිතරම කියලත් දෙන්නේ අතහරින්න ඇලෙන්න එපා කියල. එහෙම කියත්දිත් මේ කොහෙවත් යන මනුස්සයෙකුට අපි මොකටද ඇලෙන්නේ බැඳෙන්නේ.

තව කාරණයක් මේ පින්වතුන්ට මතක් කරන්න කැමතියි අමතක වෙන්න කලින්. Internet එක YouTube ඒක පාවිච්චි කිරීමේදී හොඳට පරෙස්සම් වෙන්න. අපි දේශනා කරන බණත් ඒකෙ තිබෙනවා. ඒවා රෙකෝඩ් කර ගන්න මහතවරු ඒවා දානවා. ඕස්ට්‍රේලියාව පැත්තේ ඉන්න පිංවතුනුත් දානවා. ඒක නිසා අපේ නම ගම අපි ඉන්න රටතොට දන්නා හින්ද අපේ ඊමේල් එකෙන් හරි ටෙලිෆෝන් එකෙන් හරි අපිව සම්බන්ධ කරගන්න පුළුවන්. දැන් මේ ධර්ම දේශනා දාන කොට නවසීලන්තයේ ඕක්ලන්ඩ් ශ්‍රී ලංකාරාමය කියලා දාන නිසා හැමෝම දන්නවා මේ කථනය කොහෙන්ද එන්නේ කියලා. කාට හරි දන්නේ නැති එක්කෙනෙකුට මෙහෙ අමතන්න පුළුවන්. අපේ නායක හාමුදුරුවන්ට කථා කරනවා ඒ හාමුදුරුවෝ වෙලිංටන් වලට හරවනවා. යම්කිසි ප්‍රශ්නයක් තිබුණොත් සෘජුව අපිව අමතන්න පුළුවන්.

නමුත් සමහර වීඩියෝ තිබෙනවා සද්දෙකුත් තිබෙනවා ඒවගේම භාවනත් තිබෙනවා නිවන් දැකපු අයත් ඉන්නවා ඒවා බලාගෙන අනිත් අයත් ඒවා කරනවා. ඊළඟට ඒ අයට වෙන දේට උත්තර සපයන්න කෙනෙක් ඒකෙ අස්සේ නෑ. ඒ වීඩියෝ වල address එකක් සම්බන්ධ කිරීමක් මොකක්වත් නෑ. සමහර වීඩියෝ වල concentration, healing කියලා

එක එක treatment දාලා තිබෙනවා. ඒවා බලාගෙන සමහර අය භාවනා කරනවා. ඒ වීඩියෝ වල කොහේ හරි තිබෙන ආරාම වල පොකුණු වල පින්තූර ටිකක් දාල තිබුණාට ඒකෙ එහා පැත්තේ ඉන්නේ අමු හොරෙක්, කපටියෙක්. ඒවා මේ පැත්තට පේන්නේ නෑ. ඒකෙ කියලා තිබෙන healing powers - mind fullness කියන ඒවාට අපේ අය අහුවෙනවා. ඊට පස්සේ ඒවා ක්‍රියාත්මක කරන්න යනවා තමන්ගේ ජීවිතියෙන්. වැරදුනාට පස්සේ අපේ address හොයාගෙන එනවා. අපිට උත්තර දෙන්න පුළුවන් කම තිබෙන්නේ අපි කියපු එකක මොකක් හරි තිබෙනවා නම් පමණයි. එහෙමනම් ධර්මානුකූලව අපිට උත්තර දෙන්න පුළුවන්. මේ වගේ දේවල් ගොඩක් තිබෙනවා. මම අහල තිබෙන විදියට Facebook එකෙත් එහෙමයිලු.

ඒක නිසා හරියට පරෙස්සම් වෙන්න internet එක පාවිච්චි කිරීමේදී. දන්නේ නැති ඒවාට යන්න හොඳ නෑ. Address එකක් රටක් ගමක් අව්‍යාජ තොරතුරු සපයන්නේ නැති තැන් වලට යන්න හොඳ නෑ. ඒවගේම ඒ ගොඩක් ඒවගේ තිබෙන්නේ කොහෙන් හරි කොපි කරලා modify කරපු ඒවා. අපේම වීඩියෝ අරගෙන ඒවාට music දාලා එක එක artwork දාලා වෙන පැතිවල play වෙනවා කියලා අපිට ආරංචි වෙනවා. අපේ voice එක යනවා නමුත් ඉස්සරහින් යන්නේ වෙන මලක්. දේශනා කරන කෙනා නෑ. එක එක්කෙනා එවපු නිසා තමයි මමත් දන්නේ. ඉතින් අපි දේශනා කරපු ඒවටත් ඒ වගේ වෙනවා නම් අපි කොහොමද අනිත් ඒවා සහතික කරන්නේ. ඒක නිසා හරි පරෙස්සම් වෙන්න කියන එකයි කියන්නේ. මේ විදියට භාවනා කරලා අමාරුවේ වැටිච්ච අය ගොඩක් ඉන්නවා.

අනිත් එක තමයි රෙකෝඩ් කරපු ධර්ම දේශනාවක් අහනකොට ගෞරවයෙන් යුක්තව අවධානයෙන් යුක්තව සංවර සීලීව ඇහුවොත් ඒක බණ ඇසීමක් වෙනවා. නැත්නම් ඒක ඇහෙන එකක් වෙනවා. සමහර අය එක එක ඒවා හප හපා තමයි බණ අහන්නේ. එහෙම අහනකොට ධර්ම ගෞරවයක් හිටින්නේ නෑ. එහෙම බණ කොච්චර ඇහුවත් ධර්ම අවබෝධයක් වෙන්නේ නෑ. මේකත් මේ මතක කරේ පරෙස්සමටයි.

හොඳයි හැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.